(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 108.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ජූලි මස 20 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0454/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2010 ජුනි 8 සිට 10 දක්වා සිදු කළ ඉන්දීය සංචාරයේදී දමිළ ජාතිකයින් සඳහා නිවාස 50,000 ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවට රුපියල් බිලියන විසි හතරක් ප්‍රදානය කිරීමට ඉන්දීය රජය එකඟ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල් භාවිතා කරමින් අද වන විට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන සහ එම නිවාස ලබාදුන් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) නිවාස ඉදිකිරීමට පෙර ඉන්දියාව විසින් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස ලබා දීම සඳහා අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) ඔවුන් දමිළ ජාතිකයන්ද; මුස්ලිම් ජාතිකයන්ද; සිංහල ජාතිකයන්ද;

(iii) අවතැන් වූ සියලු පුද්ගලයන් පදිංචි කරවීම සඳහා නව නිවාස කොපමණ සංඛ්‍යාවක් ඉදිකිරීම අවශ්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0918/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සේනානිගල ප්‍රදේශයේ පදිංචි කිරීමට තීරණය කර ඇති ආදිවාසී පවුල් සංඛ්‍යාව;

(ii) මේ වන විට පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව;

(iii) එම පවුල්වලට අයත් පුද්ගලයින් සංඛ්‍යාව;

(iv) එක් පවුලක් සඳහා ලබා දීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය;

(v) මේ වනවිට ඔවුන්ට ලබා දී ඇති හෝ ලබා දීමට අදහස් කර ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආදිවාසී පවුල් වෙනුවෙන් සේනානිගල ප්‍රදේශයෙන් ලබාදීමට නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය ඔවුන් වෙත ලබා නොදීමේ වැඩ පිළිවෙළක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1220/'11

3\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා ප්‍රචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජනමාධ්‍ය හා ප්‍රචාරක අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1366/'11

4\.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ සඳහා,

(i) අම්පාර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) කල්මුනේ වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයට අයත්, එක් එක් ගොවිජන සේවා කොට්ඨාසයට වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1422/'11

5\.

ගරු අජිත් කුමාර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙම වර්ෂයේදී හා ඉදිරියේදී ගාලු කොටුව තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කවරේද;

(ii) ඒ සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය හා එම ප්‍රතිපාදන ලබාදෙන ආයතන කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගාලු කොටුව තුළ තිබෙන පාසල් හෝ වෙනත් රාජ්‍ය ආයතන ඉවත් කිරීමට සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම පාසල් හෝ ආයතන ඉවත් කරන්නේ නම්, එම ගොඩනැගිලි සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගාලු කොටුව තුළ තිබෙන ඉඩම් හෝ ගොඩනැගිලි කිසියම් ව්‍යාපෘතියක් සඳහා බදු දීමට හෝ එහි ගොඩනැගිලි බැහැර කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම් හෝ ගොඩනැගිලි කවරේද;

(iii) එසේ බැහැර කරන්නේ නම්, ඊට අදාළ කොන්දේසි කවරේද;

(iv) ඉඩම් හා ගොඩනැගිලි බදු දී හෝ ගොඩනැගිලි බැහැර කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය කවරේද;

(v) ඒ සඳහා ඉඩම් හා ගොඩනැගිලි ලබා දෙන ආයතන, සමාගම් හෝ පුද්ගලයන් කවුරුන්ද;

(vi) ඒ සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0773/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010.06.29 දින නිකුත් කරන ලද මූල්‍ය කළමනාකරණ වාර්තාවට අනුව, ග්‍රේලයින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගමට රුපියල් මිලියන 400 ක බැංකු ඇපකරයක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බැංකු ඇපකරය ලබා දීමට හේතු කවරේද;

(ii) එමගින් ලැබුනු ප්‍රතිලාභය කවරේද;

(iii) එම වගකීම නිදහස් කරනු ලබන දිනය කවරේද;

(iv) සමූපකාර තොග වෙළඳ සංස්ථාව, රාජ්‍ය වෙළඳ සමාගම හෝ රාජ්‍ය වෙළඳ සමූපකාර තොග සමාගම වෙත ලබා දී ඇති රුපියල් මිලියන 4200 ක බැංකු ඇපකරය නිදහස් කර නොමැති වීමට හේතු කවරේද;

(v) ඉහත කී ඇපකරය පැවතීම හේතුවෙන් ලැබෙන ප්‍රතිලාභය කවරේද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලයේ ණය ප්‍රමාණය තවදුරටත් වැඩි කරමින් ලංකා විදුලිබල මණ්ඩලය හා ආශ්‍රිත ව්‍යාපෘති සඳහා රුපියල් බිලියන 120 ක බැංකු ඇපකරයක් ලබා දී තිබේද;

(vii) මෙම තත්ත්වය නිවැරදි කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(viii) රජය විසින් මහජන බැංකුවේ විශ්‍රාම අරමුදලෙන් මුදල් ලබා ගැනීමට හේතු කවරේද;

යන්න ඉහත සඳහන් වාර්තාවට අනුව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0987/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අවංක ක්‍රියාශීලී පොලිස් නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණින් 2005 වර්ෂයේ සිට මේ දක්වා ලබා දී ඇති මුදල් ත්‍යාග ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුණෙන් මුදල් ත්‍යාග ලබාදීම මේ වන විට නවතා ඇති බවත්;

(ii) එම දිරිගැන්වීම් නතර වීම හේතුවෙන් පොලිස් නිලධාරීන් අධෛර්යයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුදල් ත්‍යාග ලබා දීම නවතා දමා මේ වන විට ගතවී ඇති කාලය කොපමණද;

(ii) එම ත්‍යාග ලබා දීමට සුදුසුකම් ලබා සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන්ට ත්‍යාග ලබා දීමේ වැඩපිළිවෙළ නැවත ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1221/'11

8\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1367/'11

9\.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිසියම් විධායක හෝ විධායක නොවන ශ්‍රේණියක සිටින සේවකයෙකුට කිසියම් තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්වීම් ලබා දෙන්නේ දෙපාර්තමේන්තුව තුළ ඒ වෙනුවට පත් කිරීම සඳහා කිසිවෙකු නොමැති බව තහවුරු කරගැනීමෙන් පසුව පමණක් බව දැක්වෙන 2011 අංක 2 දරන චක්‍රලේඛය ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පිරිස් පාලන අංශය විසින් මෑතදී නිකුත් කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) කිසියම් තනතුරක් සඳහා සුදුසු පුද්ගලයන් දෙපාර්තමේන්තුව තුළ නොමැති බව තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ පිරිස් පාලන අංශය අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (ආ) කොටසේ සඳහන්ව ඇති පරිපාටිය අනුගමනය නොකර කොන්ත්‍රාත් පදනම මත කිසිදු පත්වීමක් ලබා නොදෙන බව තහවුරු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1423/'11

10.

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 සිට 2011 දක්වා එක් එක් වර්ෂයේදී සංචාරක මණ්ඩලයට පවරා ගන්නා ලද ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) එම ඉඩම් මේ වන විට ලබා දී ඇති ව්‍යාපෘති කවරේද;

(iii) එම ඉඩම් සඳහා ලැබී ඇති මුදල කොපමණද;

(iv) ඉහත එක් එක් ව්‍යාපෘතියට අදාළ පුද්ගලයින්, සමාගම් හෝ ආයතන කවරේද;

(v) එම පුද්ගලයන්ට, සමාගම්වලට හෝ ආයතනවලට ඉඩම් ලබාදී ඇති පදනම කවරේද;

(vi) එම ඉඩම්වල මේ වන විට අදාළ ව්‍යාපෘති ආරම්භ කර තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0850/'10

11.

ගරු රවි කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජයට, පළාත් සභාවලට සහ නගර සභාවලට අයත් මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා 2006 සිට 2011 දක්වා වෙන්කරන ලද මුදල වාර්ෂික පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2006 සිට 2010 දක්වා, ඉහත සඳහන් ආයතන තුන විසින් සියලු ආකාරයේ මාර්ග සඳහා දරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) 2012 වර්ෂයේදී මාර්ග ඉදිකිරීම හා නඩත්තුව සඳහා වෙන් කිරීමට නියමිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අ(i) හි සඳහන් මාර්ග ඉදිකිරීම් සහ නඩත්තුව සඳහා වූ අරමුදල්වල මූලාශ්‍රයන් කවරේද;

(ii) එය ණය ප්‍රාග්ධනයක් නම්, ණය ගැනුම් පිරිවැය සහ ණය ලබාදුන් රටවල් හෝ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂවල නිමකරන ලද මාර්ග ඉදිකිරීම් වෙනුවෙන් රජය විසින් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක භාරකාර අරමුදලේ (ETF) මේ වන විට තැන්පත් කර ඇති මුදල;

(ii) එහි සාමාජිකත්වය ලබා ඇති සේවක සංඛ්‍යාව;

(iii) සාමාජිකයින්ගේ මුදල් වෙනුවෙන් ලබා දෙන වාර්ෂික පොලී අනුපාතය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මුදල් සාමාජිකයන්ට නැවත ලබා දීමේ වර්ෂ 5 කාල සීමාව දීර්ඝ කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි කාලය දීර්ඝ කිරීමක් සඳහා සැලැස්මක් සකසා තිබේද;

(iii) ඉහත (ආ) (i) හෝ (ii) සිදුකර ඇත්නම්, එයට හේතු වූ කරුණු කවරේද;

(iv) ඒ සඳහා කම්කරු උපදේශන සභාවේ අනුමතිය ලබාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙටි කාලීන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සේවක භාරකාර අරමුදලේ මුදල් භාවිතා කරන සේවකයින් මුහුණ දෙන ගැටලු සඳහා ලබා දෙන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1222/'11

13.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1368/'11

14.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඔලුවිල් වරාය සංවර්ධන කාර්ය සඳහා පවරාගත් ඉඩම් වෙනුවෙන් වන්දි ලබා දී තිබෙන, අංක PP/AM/3737 දරන මිනුම් සිතියමෙහි හඳුනාගෙන ඇති ඉඩම් හිමියන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අංක PP/AM/3737 දරන මිනුම් සිතියමට අනුව යොමු අංක AD/DS/LD/LAOH/26 යටතේ කැබලි අංක 2 වශයෙන් හඳුනාගෙන, පවරා ගෙන ඇති ඉඩම වෙනුවෙන් අංක 4/11, මධ්‍යම කඳවුර, නවින්දවේලි හි පදිංචි යුසුෆ් ලෙබ්බෙ උතුමා ලෙබ්බෙ මහතාට වන්දි ගෙවා තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1425/'11

15.

ගරු අජිත් කුමාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "අපි වවමු - රට නගමු" යනුවෙන් වූ ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියෙන් ඉටු කරලීමට අපේක්ෂා කළ අරමුණු කවරේද;

(iii) එම අරමුණු ඉටු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) වෙන් කළ මුදලින් වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් කවරේද;

(iv) එම එක් එක් වැඩසටහන සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) මෙම ව්‍යාපෘතියේ ප්‍රචාරක හා උත්සව කටයුතු සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) "අපි වවමු - රට නගමු" ව්‍යාපෘතිය මේ වන විට නතර කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 5 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝගය,— 2011 වර්ෂයේ අයවැය කතාවෙහි අන්තර්ගත යෝජනාව අනුව, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මාර්තු 23 දිනැති අංක 1698/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*2.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 07 දිනැති අංක 1700/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) සහ (ඊ) ඡේද යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 මැයි 05 දිනැති අංක 1600/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 30 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2010 අගෝස්තු 04 දිනැති අංක 1665/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ නියමය,— 1957 අංක 49 දරන රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදන ලදුව, 1964 ඔක්තෝබර් 1 වැනි දින අංක 14186 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ (V) වැනි කොටස සංශෝධනය කරමින්, එම පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජුනි 30 දිනැති අංක 1712/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.07.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*7.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*8.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*15.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*16.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*17.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*18.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

20.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

21.

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

22.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

23.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**